ඔබ අතරින් කිසියම් කෙනෙකු තම කුසෙහි යමක් හට ගෙන, එය පිට වූයේ ද නැත්දැයි ඔහුට ගැටලුවක් ඇති වූ විට, හඬක් අසෙන තෙක් හෝ ගන්ධයක් දැනෙන තෙක් හෝ සුජූද් කරන තැනින් ඔහු ඉවත්ව නොයා යුතුය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. "ඔබ අතරින් කිසියම් කෙනෙකු තම
කුසෙහි යමක් හට ගෙන, එය පිට වූයේ ද නැත්දැයි ඔහුට ගැටලුවක් ඇති වූ විට, හඬක් අසෙන
තෙක් හෝ ගන්ධයක් දැනෙන තෙක් හෝ සුජූද් කරන තැනින් ඔහු ඉවත්ව නොයා යුතුය."
[صحيح] [رواه مسلم]

සලාත් ඉටු කරන්නෙකුගේ කුසෙහි යම් ගැටලුකාරී තත්ත්වයක් හට ගෙන ඉන් යමක් පිට වූයේ ද නැත්දැයි ඔහුට ගැටලුවක් ඇති වූ විටෙක, වාතයේ හඬ ඇසීමෙන් හෝ වාතයේ ගන්ධය දැනීමෙන් හෝ ඔහුගේ වුළූ දෝවනය බිඳ දමන එවැනි යමක් සහතික වන තෙක් නැවත වුළූ ගැනීම සඳහා සලාතය අත්හැර ඉන් බැහැර ව නොයා යුතුය. හේතුව යමක දැඩි ස්ථාවරයක සිටින්නාට සැකය එය අවලංගු නොකරන බැවිනි. සැබැවින්ම ඔහු පිරිසිදු තත්ත්වයේ සිටින බව ස්ථීර ය. නමුත් ඔහු තුළ කිලිටි ඇතිවීම සැකසහිත වූවකි.

http://sunnah.global/hadeeth/si/show/65083